# ඉඩම් මැනුම් සභාව

## (2002 අංක 17 දරන මැනුම් පනතින් ස්ථාපිත වී ඇත)

## "මධ්‍යම මට්ටමේ කළමනාකරණ සේවා" ගණයෙහි ලේකම් තනතුර සඳහා අයදුම්පත් කැඳවීම

01. ඉඩම් මැනුම් සභාවේ ලේකම් තනතුර සඳහා ස්ත්‍රී/ පුරුෂ දෙපාර්ශවයෙන්ම අයදුම්පත් භාරගනු ලැබේ. අයදුම්කරුවන් ශ්‍රී ලංකා පුරවැසියන් විය යුතු අතර, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ආයතනයකින් උපාධියක් ලබා තිබීම සහ උපාධිය ලබාගැනීමෙන් පසු රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරක් වසර එකට (01) නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය.

02. අයදුම්කරුවන් 2022.09.09 දිනට වයස අවුරුදු 22 ට නොඅඩු අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. ඔවුන් ලේකම් තනතුරට පැවරෙන කාර්යයන් සහ වගකීම් මැනවින් ඉටුකිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයකින් හා විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

03. මෙම තනතුරට අදාළ කාර්යභාරයන් www.landsurveycouncil.org යන අපගේ වෙබ් අඩවියෙන් ලබාගත හැක.

04. බඳවාගනු ලබනුයේ එක් අයකු පමණක් වන අතර, තෝරාගත් අයදුම්කරුවන් සීමිත ප්‍රමාණයක් සම්මුඛ පරීක්ෂණයකට කැඳවා සුදුසු අයෙකු තෝරා ගැනීම සිදුකරනු ඇත. කිනම් ආකාරයක හෝ බලපෑමක් සිදුකිරීමට උත්සාහ ගතහොත් එම තැනැත්තාට එය අවාසිදායක තත්ත්වයක් ඇති වීමට ඉඩ ඇත.

05. මෙම තනතුරට අදාළ වැටුප් පරිමාණය පහත සඳහන් පරිදි වේ.

MM-1-1 රු. 53,175 -10X1,375-15X1,910-95,575

06. මෙම පත්වීම ස්ථිර පත්වීමක් වන අතර, වසර තුනක පරිවාස කාලයකට යටත් වේ. අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට හිමිකම් ඇත.

07. අයදුම්කරුවන් තම සම්පූර්ණ නම, ලිපිනය, උපන් දිනය, අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද පරිගණක භාවිතය අදාළ දැනුමක් ඇත්නම් ඒ පිළිබඳවද සඳහන් කළ ඉල්ලුම් පත්‍රයක් තමා විසින්ම පිළියෙළ කර 2022.09.09 දින හෝ එදිනට පෙර "**සභාපති, ඉඩම් මැනුම් සභාව, අංක 150, බර්නාඩ් සොයිසා මාවත, කොළඹ 5**" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය අධ්‍යාපන හා වෘත්තීය පුහුණුව පිළිබඳ සහතිකවලද, උප්පැන්න හා ජාතික හැඳුනුම්පත්‍රයේද ඡායා පිටපත් පමණක් අයදුම්පත සමග එවිය යුතුය.

**ඒ. දිසානායක**

**සභාපති, ඉඩම් මැනුම් සභාව.**

**2022.08.15**